# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

# වාර්ෂික වාර්තාව

# 2015

# 2015.01.01 සිට 2015.12.31 දක්වා

# වාර්ෂික වාර්තාව

## පටුන


| | *විස්තරය* | *පිටු අංකය* |
|---|---|---|
| 1. | හැඳින්වීම | 1 |
| 2. | දැක්ම | 1 |
| 3. | මෙහෙවර | 1 |
| 4. | විනිශ්චය අධිකාරයේ පත්කිරීම් | 1 |
| 5. | බලතල හා කාර්යයන් | 1 |
| 6. | අභියාචනයක් ඉදිරිපත් කිරීම | 1 |
| 7. | අභියාචනයක් ඉදිරිපත් කල පසු ගන්නා පියවර | 1 |
| 8. | කාල සීමාව | 1 |
| 9. | විනිශ්චය අධිකාරයේ තීරණ | 2 |
| 10. | වැඩ සැලැස්ම | 2 |
| 11. | ඉදිරිපත් වූ අභියාචනා වල අන්තර්ගතය | 2 |
| 12. | අභියාචන සම්බන්ධයෙන් සංඛ්‍යාලේඛන 2015 | 2 |
| 13. | 2015 වර්ෂයේ අවසන් අභියාචනා සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණ | 3 |
| 14. | තීරණ / නියෝග දීමේ ගැටළු | 3 |
| 15. | මුදල් ප්‍රතිපාදන 2015 වර්ෂය | 3-4 |
| 16. | කාර්ය මණ්ඩලය | 4 |
| 17. | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ කාර්යාලය | 4 |

# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

## 2015.01.01 සිට 2015.12.31 දින දක්වා

## වාර්ෂික වාර්තාව

1. **හැඳින්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59 (1) ජේදය යටතේ වූ 2002 අංක 4 දරණ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධි විධානයන් ප්‍රකාර පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පිහිටුවා ඇත.

2. **දැක්ම**

පරිපාලනමය සාධාරණත්වය ඉටු කරදීම සඳහා වන සුහදශීලි හා ප්‍රවීණ ආයතනයක් ලෙස ක්‍රියාකාරීවීම.

3. **මෙහෙවර**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ix වැනි පරිච්ජේදයෙන් පවරා ඇති බලතල ක්‍රියාත්මක කරමින් රාජ්‍ය නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණයක් හෝ නියමයක් පිළිබඳව ගුණාත්මක සහ ස්වාධීන සමාලෝචනයක් සිදු කර පරිපාලනමය සාධාරණත්වය ඉටුකරදීම.

4. **විනිශ්චය අධිකාරය පත්කිරීම**

පනතේ 2 වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සභාපතිතුමා ඇතුළු තිදෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් පත්කරනු ලැබේ.

5. **බලතල සහ කාර්යයන්**

රාජ්‍ය නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දෙනු ලබන තීරණයන්ට සහ නියමයන්ට එරෙහිව ගොනු කරනු ලබන අභියාචනා විමර්ෂනය කර විනිශ්චයන් ලබාදීම.

6. **අභියාචනයක් ඉදිරිපත් කිරීම**

2002 අංක 4 දරණ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ 4 (1) සහ 4 (2) අනුව ඉදිරිපත් කළ යුතුය.

7. **අභියාචනයක් ඉදිරිපත් කළ පසු ගන්නා පියවර**

එකී පනතේ 5 (1) සහ 5(2) ක්‍රියාපරිපාටිය මූලික පියවර ගෙන 6 (අ), (ආ), (ඇ), (ඈ) අනුව ක්‍රියා කිරීම.

8. **කාලසීමාව**

අදාල පනතේ 7 වගන්තියේ සඳහන් පරිදි අභියාචනයක් ලැබී මාස 2 ක් ඇතුලත අවසන් වශයෙන් සුදුස්සක් කළ යුතු බව සඳහන් වේ.

## 9. විනිශ්චය අධිකාරයේ තීරණ

එකී පනතේ 8 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු සිදු කරනු ලබන අතර 8 (2) වගන්තිය අනුව එකී තීරණයන් අවසානාත්මක සහ තීරණාත්මක වන අතර එය යම් අධිකරණයක නඩු කටයුත්තකදී ප්‍රශ්න කළ නොහැකි බව සඳහන් වේ.

## 10. වැඩ සැලැස්ම

අභියාචනයක් මෙම විනිශ්චය අධිකාරය වෙත ලැබුණු පසු පහත අනුපිළිවෙළ යටතේ ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර ඇත.

| | | |
|---|---|---|
| i. | අභියාචනය ලියාපදිංචි කර දින නියම කර නොතිසි යැවීම හා කැඳවීම සඳහා | සති ගණන 03 |
| ii. | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර නිරීක්ෂණ වාර්තා කැඳවීමට | සති ගණන 04 |
| iii. | නිරීක්ෂණ වාර්තා සම්බන්ධයෙන් අභියාචකගේ ප්‍රති උත්තර ලබා ගැනීමට | සති ගණන 04 |
| iv. | අදාල අභියාචනය සම්බන්ධයෙන් විමසම් සඳහා | සති ගණන 08 |
| v. | ලිඛිත සැලකිරීම් සඳහා | සති ගණන 08 |
| vi. | නියෝගය ලබාදීමට සඳහා | සති ගණන 04 |
| | අභියාචනයක් සම්බන්ධයෙන් විභාග කොට විනිශ්චය කිරීම සඳහා උපරම වශයෙන් ගතවන කාලය | සති ගණන 31 |

## 11. ඉදිරිපත් වූ අභියාචනාවල අන්තර්ගතය

මේ දක්වා මෙම විනිශ්චය අධිකාරය වෙත පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කර ඇත.

I. උසස්වීම්
II. සේවය හැර යාම / නැවත සේවයේ පිහිටුවීම
III. විනය නියෝග
IV. ස්ථාන මාරු කිරීම්
V. විශ්‍රාම යාම/ ගැන්වීම සම්බන්ධ
VI. ජ්‍යෙෂ්ඨතාවය සම්බන්ධව

## 12. අභියාචනා සම්බන්ධ සංඛ්‍යාලේඛ 2015

| | |
|---|---|
| 2014.12.31 දිනට ඉදිරියට ගෙන ආ අභියාචනා සංඛ්‍යාව | 594 |
| 2015 වර්ෂය තුළ ඉදිරිපත් වූ අභියාචනා සංඛ්‍යාව | 244 |
| එකතුව | 838 |
| 2015 වර්ෂය තුළ අවසන් කරන ලද අභියාචනා සංඛ්‍යාව | 166 |
| 2015 වර්ෂය තුළ අවසන් නොවූ අභියාචනා සංඛ්‍යාව | 672 |

13. <u>2015 වර්ෂයේ අවසන් අභියාචනා සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණ</u>

| | | | |
|---|---|---|---|
| I. | නිෂ්ප්‍රභා කරන ලද අභියාචනා සංඛ්‍යාව | - | 117 |
| II. | තීරණයක් නොමැතිව බහා තබන ලද අභියාචනා සංඛ්‍යාව | - | 06 |
| III. | අභියාචනයේ සඳහන් සහන ලබාදෙන ලද අභියාචනා සංඛ්‍යාව | - | 35 |
| IV. | අභියාචක විසින් ඉල්ලා අස්කරගත් අභියාචනා සංඛ්‍යාව | - | 08 |
| | 2015 වර්ෂයේ අවසන් කරන ලද අභියාචනා සංඛ්‍යාව | - | 166 |

14. <u>තීරණ / නියෝග දීමේ ගැටළු</u>

අභියාචනයක් ලැබී මාස 2 ක් ඇතුලත අවසන් වශයෙන් සුදුස්සක් කල යුතු බව සඳහන් වුවත් (පනතේ 7 වගන්තිය අනුව) සියලුම අභියාචනා විවෘත අධිකරණයේ කැඳවනු ලබන අතර එම අවස්ථාවලද පැන නගින ප්‍රායෝගික ගැටළු මත පනතේ 7 වගන්තය අනුව කටයුතු කිරීමට නොහැකි වන අවස්ථා ඇත.

උදාහරණ වශයෙන් අභියාචක වෙනුවෙන් පෙනී සිටින නීතිඥ මහතුන් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභා නිළධාරීන් විසින් විවිධ හේතු දක්වමින් දින ඉල්ලා සිටින අවස්ථාවලදී සාධාරණ හේතු මත එයට ඉඩ දීමට සිදු විය හැක.

<u>සටහන</u>

**කෙසේ වෙතත් ඉදිරිපත් කර ඇති වැඩ සැලැස්ම උපයෝගී කර ගෙන අවම කාලසීමාවක් තුල අභියාචනා කඩිනමින් විමර්ෂනයට ලක්කර විනිශ්වයන් ලබාදීමට සැම පියවරක්ම ගැනිමට කටයුතු කර ඇත.**

15. <u>මුදල් ප්‍රතිපාදන 2015 වර්ෂය</u>

2002.09.12 දිනැති අංක 402 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2:4:2 අනුව

I.

| වියදමේ ස්වභාවය | වාර්ෂික මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදන රු. | සියළු ගැලපීම් කිරීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදන රු. | තථ්‍ය වියදම 2015.12.31 දිනට රු. |
|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 8,100,000 | 9,500,000 | 9,482,147 |
| අනෙකුත් පුනරාවර්තන | 9,500,000 | 13,630,000 | 13,435,145 |
| මූලධන වියදම් | 1,125,000 | 1,125,000 | 557,786 |
| වෙනත් මූලධන | 75,000 | 75,000 | - |
| එකතුව | 18,800,000 | 24,330,000 | 23,475,078 |

II. **අත්තිකාරම් බී ගිණුම සම්බන්ධයෙන් නිශ්චිත සීමාවනට සාපේක්ෂ තථ්‍ය ඇස්තමේන්තු 2015 වර්ෂය**

| | වියදමේ උපරිම | ලැබීම් අවම සීමාව | හර ශේෂය උපරිම සීමාව |
|---|---|---|---|
| ඇස්තමේන්තු මුදල | 1,170,000 | 355,000 | 2,800,000 |
| තථ්‍ය අගය | 645,954 | 732,764 | 1,370,675 |

16. **කාර්ය මණ්ඩලය**

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| i. | ජ්‍යෙෂ්ඨ මට්ටම | 02 | 02 | - |
| ii. | තෘතියික මට්ටම | - | - | - |
| iii. | ද්විතියක මට්ටම | 12 | 12 | - |
| iv. | ප්‍රාථමික මට්ටම | 04 | 04 | - |
| | **එකතුව** | 18 | 18 | - |

17. **පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ කාර්යාලය**

දැනට මෙම පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ කාර්යාලය රාජගිරිය, සිල්වා පටුමග හි අංක 35 දරණ ස්ථානයේ පිහිටා ඇත. දුරකථන අංක 011- 2877685 වේ.

*************